ප්‍රසම්පාදන දැන්වීමයි

අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ (PSDG) කර්මාන්ත 02 ක් , සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන (GEMP) යටතේ කර්මාන්ත 08 ක් , දිට්වා සුළි කුණාටුවෙන් ආපදාවට ලක්වූ පාසල් පුනරුත්ථාපන වැඩසටහන යටතේ (Ditwah) කර්මාන්ත 11 ක් ,වතු පාසල්වල පාසල් ගොඩනැගිළි අළුත්වැඩියාකිරීමේ ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කර්මාන්ත 05 ක් , අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කර්මාන්ත 22 ක් ඉටුකිරීම සහ මධ්‍යම අයිවේගී මාර්ග ව්‍යාපෘති අංක 03 ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර්මාන්ත 02 ක් ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවීම

සියළුම ලංසුකරුවන් වෙත.

පූර්ව ලංසු සාකච්ඡා තීරණ දැනුම්දීම - 2026.11.16 දින පෙ.ව.10.30

සහභාගීත්වය

අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ(ක්‍රම සම්පාදන) /,ප්‍රධාන ගණකාධිකාරී ඇතුළු මාගේ සහභාගීත්වයෙන් පූර්ව ලංසු සාකච්ඡාව ආරම්භ විය.අද දින වෘත්තීය ක්‍රියාමාර්ග අනුව සේවයට වාර්තාකර නොමැති බැවින් ඉංජිනේරුවන් හා කාර්මික නිලධාරීන් මෙම පූර්ව ලංසු සාකච්ඡාව සඳහා සහභාගී නොවුණි.

ලංසු ලේඛන සහ ලංසු බැඳුම්කරය නිවරදිව සම්පූර්ණකර ඉදිරිපත්කිරීමේ වැදගත්කම, ලංසු බැඳුම්කරයේ වලංගු කාලය නිවරදිව සඳහන්කිරීම ආදී කරුණු සහ ඉල්ලා ඇති සුදුසුකම් පිළිබඳ ලේඛන නිවරදිව ලංසුව සමග ඉදිරිපත්කිරීමේ වැදගත්කම පැහැදිලි කරන ලදී.

එසේම මෙම ප්‍රසම්පාදන දැන්වීම යටතේ ලංසු කැඳවා ඇති කර්මාන්ත සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව දින දෙකකදී ලංසු විවෘතකිරීමට සිදුවීම පිළිබඳ පැහැදිලි කරන ලදී.

ලංසුකරුවන් විසින් අදහස් දක්වමින් මෙම කර්මාන්ත සඳහා ලංසු ඉදිරිපත්කිරීමෙන් පසු කර්මාන්ත ප්‍රදානයකිරීමට කොපමණ කාලයක් ගතවන්නේද යන්න හා බිල්පත් ඉදිරිපත්කල යුතු පිළිවෙල සම්බන්ධයෙන් විමසන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ(ක්‍රම සම්පාදන) විසින් ගිවිසුම් කාලය තුලම කර්මාන්තවල ඉදිකිරීම් අවසන්කිරීවේ වැදගත්කම හා බිල්පත් ඉදිරිපත්කිරීමේදී අවශ්‍ය සියළු ලේඛන සමග අඩුපාඩු රහිතව ඉදිරිපත්කිරීමේ අවශ්‍යතාවයත්,කොන්ත්‍රාත් කාලය දීර්ඝකිරීම අවශ්‍ය වන්නේනම් ගිවිසුම් කාලය ඉක්මවීමට පෙර ඒ සඳහා නිශ්චිත හේතු සහිතව ඉල්ලීම් ඉදිරිපත්කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන ලදී.

මෙම පූර්ව ලංසු සාකච්ඡාවේදී පහත තීරණ ගන්නා ලදී

01. අමාත්‍යාංශය දැනට නිකුත්කර ඇති ප්‍රසම්පාදන දැන්වීම අනුව සකස්කර ඇති ලංසු ලේඛන අනුව ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට තීරණය විය.

02.මෙම පූර්ව ලංසු සාකච්ඡා තීරණය සබරගමුව පළාත් සභාවේ www.sg.gov.lk වෙබ් අඩවියතුල ඇති ටෙන්ඩර් දැන්වීම් වෙබ් පිටුව හෝ www.moe.sg.gov.lk යන අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් පිටුව මගින් ලංසුකරුවන්ට ප්‍රසිද්ධ කිරීම.

වෙනත් විශේෂිත කරුණු මෙම ප්‍රසම්පාදන දැන්වීම සම්බන්ධයෙන් ලංසුකරුවන්ගේ පාර්ශවයෙන් ඉදිරිපත් නොවූ බැවින් මෙම පූර්ව ලංසු සාකච්ඡාව පෙ.ව.11.00 ට පමණ අවසන්කරන ලදී.

ජී.ඩී. ලක්මලි යූ. කුමාරි
ලේකම්
අධ්‍යාපන , තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවානගරය - රත්නපුර

ජී.ඩී.ලක්මලී යූ.කුමාරි .
ලේකම්
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාශය.